**මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාව - 2022**
**---------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම )**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු කලින් ගෙවන්නන්ට ලබා දුන් සියයට 10 ක වට්ටම් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස අනාවරණය කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී, ලබාදුන් වට්ටම් ගිණුම්ගත කිරිමට පියවර ගෙන ඇති බව. | ලබා දුන් වට්ටම් මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස අනාවරණය කළ යුතුය. |
| (ආ) | කුළුවිනමඩු ප්‍රජා පානීය ජල සැපයුම් ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු ජල ගාස්තු රු.312,415ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ සිට හිඟහිටි ජලගාස්තු මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් ලෙස අනාවරණය කරන බව. | හිඟ හිටි ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස අනාවරණය කළ යුතුය. |
| (ඇ) | සභාව විසින් පවත්වන පරිගණක පාඨමාලා සඳහා සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අයකළ යුතු ගාස්තු රු.94,000ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂවල මෙම හිඟහිටි මුදල් ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන බව. | -එම- |
| (ඈ) | ස්ථාවර තැන්පත් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු පොලී රු.75,253ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී බැංකුවෙන් තොරතුරු ලබාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට නියමිත ආදායම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| ඉදිරිපත් නොකළ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.59,625,995 ක් වටිනා ගිණුම් ශේෂ 04 ක් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස විගණනයට ඉදිරිපත් කළ නොහැකි විය. | අඩුපාඩු සම්පූර්ණ කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව. | ගිණුම් ශේෂ සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය සහ මඩකලපුව දිස්ත්‍රික් පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2013 ජූලි 10 දිනැති අංක BT/ACLG/PL/Road/2013 | සභා බලප්‍රදේශයට අයත් මාර්ග 253 ක් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර නොතිබුණි. | ඉතිරි මාර්ග 253ට නම් යොදා ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කිරිමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | මාර්ග ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කිරිමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.109,484 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 11,270,709 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i) | වරිපනම් හා බදු | 745,200 | 786,640 | 903,460 | 94,405 | 729,655 | 732,565 | 521,340 | 211,225 |
| ii) | කුලී | 810,100 | 681,350 | 681,350 | -- | 795,100 | 352,900 | 352,900 | -- |
| iii) | බලපත්‍ර ගාස්තු | 1,942,850 | 2,040,920 | 2,040,920 | -- | 978,000 | 1,141,867 | 1,141,867 | -- |
| iv) | වෙනත් ආදායම් | 23,212,500 | 38,158,456 | 38,755,715 | 2,796,511 | 22,720,265 | 33,392,891 | 35,794,464 | 3,393,770 |
| | | 26,710,650 | 41,667,366 | 42,381,445 | 2,890,916 | 25,223,020 | 35,620,223 | 37,810,571 | 3,604,995 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ සියළුම ආදායම් රැස්කිරීම්වල කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලැබිය යුතු පසුගිය වර්ෂ 05කට අදාල මුද්දර ගාස්තු රු.3,622,850 ක් ප්‍රතිපූර්ණය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | හිඟහිටි මුද්දර ගාස්තු අයකර ගැනීමට පියවර ගෙන ඇති බව. | මුද්දර ගාස්තු ආදායම් ගෙන්වා ගැනීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සභාව විසින් දිරන කසල කිලෝග්‍රෑම් 114,877ක් රැස් කර තිබුණු නමුත් කාබනික පොහොර සකස් කර තිබුණේ කිලෝග්‍රෑම් 4,000 ක් පමණි. එසේම 2021 වර්ෂයේ සභාවට ලැබුණු කසල කැපීමේ යන්ත්‍රෝපකරණ පද්ධතිය සහ Compost Screener යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා භාවිතා කර නොතිබුණි. | වර්තමානයේ සුදුසු ක්‍රමවේදයකින් මෙය ඉදිරියට කරගෙන යන බව. | කාබනික පොහොර සකස් කිරීමේ ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සභාවට අයත් ට්‍රැක්ටර් 02ක් සහ ජල බවුසර 02ක් වර්ෂ 07ක සිට අළුත්වැඩියා නොකර පැවැතුණි. | වාහන අළුත්වැඩියා කිරීමට පියවර ගන්නා බව. | වාහන අළුත්වැඩියා කිරිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වෙනත් දෙපාර්තමේන්තු විසින් සභාවට ලබාදුන් වාහන දෙකක්, ට්‍රැක්ටර් 03ක්, ට්‍රේලරයක් සහ ජල බවුසරයක් සභාවේ නමට පවරා ගෙන නොතිබුණි. | වාහනවල හිමිකාරිත්වය මාරු කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | වාහනවල හිමිකාරිත්වය මාරු කිරීමට පියවර ගත යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1 මාර්ගෝපදේශය සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2006 මාර්තු 26 දිනැති අංක 128 දරන චක්‍රලේඛය ප්‍රකාරව, මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සභාව විසින් සකස් කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම නියමිත ආකෘතියේ සකස් කරන බව. | ප්‍රසම්පාදන සැලැස්ම නියමිත ආකෘතියේ සකස් කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **සේවක පුරප්පාඩු සහ අතිරික්ත** | | |
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්යමණ්ඩල ලැයිස්තු ප්‍රකාරව, සභාවේ පැවැති තනතුරු 05ක් සඳහා පුරප්පාඩු 10ක් සහ අතිරික්ත සේවකයින් 09ක් විය. | පුරප්පාඩු සම්බන්ධයෙන් අදාල බලධාරීන්ට කාර්තුමය වාර්තා ඉදිරිපත් කර ඇති බව. | පුරප්පාඩු පිරවීමට සහ අතිරික්ත සේවකයින් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමර්ග ගැනීමත් සිදු කළ යුතුය. |
| (ආ) **සේවක ණය**<br>සභාවේ සේවය කර 2013 වර්ෂයේ තනතුරු අත්හිටවූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය රු.39,297ක් විය. | හිඟ ණය නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | හිඟහිටි සේවක ණය අය කර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2)උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික කාර්යසාධන වාර්තාව කඩිනමින් ඔබ වෙත ඉදිරිපත් කරන බව. | වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික අයවැය ප්‍රකාරව, සභාව විසින් ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම් 11 ක් සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට කටයුතු කර ඇති බව. | අයවැය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.3 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික පරිසර පනතේ 23(අ) වගන්තිය ප්‍රකාරව, නිෂ්චිත මෙහෙයුමක් කිසිදු පුද්ගලයෙකු පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නොමැතිව සිදුකළ නොහැකි වේ. එසේ වුවත්, සභාවේ පරිපාලන බලප්‍රදේශයේ ක්‍රියාත්මක වන කර්මාන්ත ශාලා 26ක් හඳුනාගෙන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමානයේ මධ්‍යස්ථාන 08 කට බලපත්‍ර නිකුත් කර ඇති අතර ඉතිරි ඒවාට නිකුත් කිරීමට පියවර ගෙන ඇති බව. | කර්මාන්ත ශාලා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගැනීමට පියවර ගත යුතුය. |